උඩරට මැණිකේ දුම්රියේ ගමන් ගත් විදේශීය කාන්තාවකට, බිම සිට සෙරෙප්පුවකින් පහර දීමේ චෝදනාව මත පුද්ගලයෙකු අත්අඩංගුවට පත් වීමේ පුවත, අරුණ සහ මව්බිම පුවත්පත් (පෙබ. 24, 2023) තුළ ආවරණය වී තිබුණේ මෙසේය.

අරුණ - "සුද්දිට සෙරෙප්පුවෙන් ගසා හොඳ පරිප්පුවක් කයි" (අන්තර්ගතය තුළ: "විදේශ කාන්තාවකට")

මව්බිම - "උඩරට මැණිකෙත් එක්ක ගිය විදෙස් කතට සෙරෙප්පුවෙන් ගැසූ සැකකරු අත්අඩංගුවට"

"සුද්දා" හෝ "සුද්දී" වැනි යෙදුම් ඔස්සෙ, සමේ වර්ණය මත පදනම්ව විදේශිකයින්ව කොන් කිරීමේ ආකල්පයන් ප්‍රවර්ධනය විය නොහැකිදැයි Ethics Eye අපි මින් පෙර ද අසා ඇත්තෙමු. විශේෂයෙන්ම සංචාරක කර්මාන්තය මුල් මුල්බැසගෙන ඇති ශ්‍රී ලංකාව වැනි රටක, සමේ වර්ණය පදනම් කරගනිමින් විදේශිකයින් ව මෙසේ කොන්කරන සුළු යෙදුම් මාධ්‍ය තුළ භාවිතා වීම කෙතරම් යෝග්‍ය දැයි අප සිතිය යුතුය.

එසේම, "සුදු සමැති" පුද්ගලයින්, ඉන් වෙනස් සමේ වර්ණයක් සහිත ජාතීන් හා සැසඳීමේදී වඩාත් උසස් ය යන ආකල්පය ද, එවැනි යෙදුම් ඔස්සේ ඉදිරිපත් වීම ද ගැටළුවකි.

1) ඒ අනුව, "සුද්දි" වැනි යෙදුම් ඔස්සේ, විදේශිකයින්ව සමේ වර්ණය පදනම් කරගනිමින් කොන් කිරීමක් සිදු නොවනු ඇති ද? ඒ වෙනුවට "විදේශීය කාන්තාව", "විදෙස් කත" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

2) ඒ අනුව, වඩාත් යෝග්‍ය භාෂා භාවිතයක් සහිත පුවත් වාර්තාව ලෙසින් ඔබ තෝරාගන්නේ කුමක් ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

